**නැගෙනහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්‍ෂණික) සේවා ගණයට අයත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී තනතුරේ (විශේෂ ශ්‍රේණිය)ට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත උසස්කිරීම - 2019**

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී (විශේෂ ශ්‍රේණිය) තනතුරට සේවා පළපුරුද්ද හා කුසලතා පදනමින් උසස්කිරීම සඳහා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී තනතුරේ I ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.05.15 වේ. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**02. උසස්කිරීම සඳහා වන සේවා කොන්දේසි :-**

2.1 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස්කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

2.2 මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුතුව සිටිය යුතුය.

2.3 ඉහත සඳහන් තනතුර සඳහා නැගෙනහිර පළාත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී තනතුරේ I වන ශ්‍රේණියේ සුදුසුකම් සපුරන ලද නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයකින් තොරව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. වැටුප ඃ-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට අනුව,
රු. 41,580-11x755-18x1030- රු. 68,425/- වේ. (MN-7-2016)
මෙම වැටුප් පරිමාණයෙහි 4 වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

**04. පොදු සුදුසුකම් ඃ-**

4.1 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

**05. බඳවාගැනීමේ ක්‍රමය :-**

5.1 නැගෙනහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) අධි පන්තිය සේවා ගණයට අයත් මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී (විශේෂ ශ්‍රේණිය) තනතුර සඳහා වන උසස්කිරීමේ පරිපාටියට හා ඉහත 2.2 හි විධිවිධානවලට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

5.2 නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතා සඳහා ලකුණු ලබාදෙනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵලවලට අනුව අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් බලධාරියා විසින් විශේෂ ශ්‍රේණියට උසස්කිරීම සිදුකරනු ලැබේ.

5.3 සෑම අයදුම්කරුවකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර නියමිත සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06. මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි (විශේෂ ශ්‍රේණිය) තනතුරට උසස්කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය සඳහා අවශ්‍යවන සුදුසුකම්**

**i. වයස් සීමාව**

කුසලතා පදනමින් උසස්කිරීම් සිදුකිරීමේදී උපරිම වයස් සීමාව අදාල නොවේ.

**ii. යෝග්‍යතාවය**

I. මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි තනතුරේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හයම (06) උපයාගෙන ඇති නිලධාරියෙකු වීම.

II. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හයක් (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී තිබීම.

**iii.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ-**

| **ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ** | | **උපරිම ලකුණු** |
|---|---|---|
| (i) | සේවා පළපුරුද්ද | 50 |
| (ii) | කුසලතාවය | 45 |
| (iii) | සම්මුඛ පරීක්‍ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 |
| **මුළු ලකුණු** | | 100 |

**(iv) ලකුණු ලබාදීමේ පිළිවෙළ**

**(i) සේවා පළපුරුද්ද**

a) මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි I වන ශ්‍රේණියෙහි වසර හයක (06) සේවා කාලයෙන් පසුව සේවය කරන ලද එක් එක් පූර්ණ වර්ෂය සඳහා වසරකට ලකුණු හතරක් (04) බැගින් හිමි වේ.

b) මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි I වන ශ්‍රේණියෙහි වසර හයක (06) සේවා කාලයෙන් පසුව සේවය කරන ලද වසරකට අඩු නමුත් මාස 06 කට වැඩි කාලයක් සඳහා ලකුණු දෙකක් (02) හිමි වේ.

c) මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි I වන ශ්‍රේණියෙහි වසර හයක (06) සේවා කාලයෙන් පසුව සේවය කරන ලද මාස හයකට අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.

**(ii) කුසලතාවය**

a) පත්කිරීම් බලධාරියා විසින් නිකුත් කළ ලිපිය මත මහජන සෞඛ්‍ය කේෂ්ත්‍ර නිලධාරි - විශේෂ ශ්‍රේණිය තනතුරේ වැඩ බැලීම සඳහා එක් පූර්ණ වර්ෂයකට ලකුණු හතරක් බැගින් උපරිම ලකුණු දොළහක් (12) හිමි වේ. වසරකට අඩු නමුත් මාස 06 කට වැඩි කාලයක් සඳහා ලකුණු දෙකක් (02) හිමි වේ. මාස හයකට අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.

b) දෙපාර්තමේන්තු ප්‍රධානි හෝ එයට ඉහළ තනතුරු දරන නිලධාරීන් විසින් ලබාදී ඇති සේවා ඇගයීම් සහතික පත්‍ර සඳහා එක් සහතිකයකට ලකුණු දෙකක් (02) බැගින් උපරිම ලකුණු අටක් (08) හිමි වේ. මෙම සහතික පත්‍ර නියමිත ආකෘතියට අදාල විය යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානි විසින් සහතික කර තිබිය යුතුය.

c) සෞඛ්‍ය විෂය හා සම්බන්ධ පුහුණු හා ශිෂ්‍යත්ව සඳහා එක් අවස්ථාවකට ලකුණු දෙකක් (02) බැගින් උපරිම ලකුණු අටක් (08) හිමිවේ.

d) විශ්ව විද්‍යාල උපාධි සහතිකය සඳහා ලකුණු හතක් (07) ක්ද, ඩිප්ලෝමා සහතික (විශ්ව විද්‍යාල හෝ එවැනි සම තත්ත්වයේ පිළිගත් ආයතන මගින් පවත්වනු ලබන වසරකට වඩා වැඩි ඩිප්ලෝමා පාඨමාලා වලින් ලබාගත් සහතික) සඳහා එක් සහතිකයකට ලකුණු දෙක (02) බැගින් උපරිම ලකුණු දහයක් (10) හිමිවේ.

**07. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

7.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතුය.

7.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි විශේෂ ශ්‍රේණියට උසස්කිරීම - 2019" යනුවෙන් සඳහන් කළ යුතුය.

7.3 අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

7.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2019.05.15 වැනි දින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. (ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)

**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

එම්.වයි. සලීම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි (විශේෂ ශ්‍රේණිය)ට සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත උසස්කිරීම - 2019**

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ………………………………………

**1.0** 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා : Mr. PERERA, A.B.C.)

1.2 සම්පූර්ණ නම : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………………

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්) ……………………………………………………………………

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M ☐
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

1.5 දුරකතන අංකය : ……………………………………………………………………

**2.0** 2.1 ස්ථිර ලිපිනය : ……………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………………

2.2 ස්ථිර ලිපිනය : ……………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්) ……………………………………………………………………

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : …………………………………………………………………….
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ……………………………………………………………………

**3.0** 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 2019.05.15 දිනට වයස : වර්ෂ ☐☐ මාස ☐☐ දින ☐☐

**4.0** ජනවර්ගය : සිංහල ☐ ශ්‍රී ලාංකික දෙමළ ☐ මුස්ලිම් ☐
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)

**5.0** ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : …………………………………………………………………………………...

**6.0 නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම්,**

6.1 දෙපාර්තමේන්තුව : ………………………………………………………………….

6.2 වර්තමාන ශ්‍රේණිය : ………………………………………………………………….

6.3 වර්තමාන ශ්‍රේණියට උසස්කළ දිනය : ………………………………………………………………….

## 7.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා’විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා’විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, උසස්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ උසස්කිරීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………..……                ..……………….…………………..……
අයදුම්කරුගේ අත්සන

## 8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………………………..……………..මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ……………...………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

………………………………..
අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ……………………...……
සහතික කරන්නාගේ නම : ……………………...……
තනතුර : ……………………...……
ලිපිනය : ……………………...……
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

## 9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරියෙකු වශයෙන් සේවය කරන ------------------------- -----------------මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. උසස් කිරීමේ දැන්වීම ප්‍රකාරව මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා ඇති බවද ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවද මෙයින් සහතික කරමි.

………………………………..
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ……………………...……
නම : ……………………...……
තනතුර : ……………………...……
ලිපිනය : ……………………...……
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)